චක්‍රලේඛ අංක : 4 / 2011 (I)

මගේ අංකය :- බ.ප.ස.සේ.කො.ස/ලේ.හිර/2011
සමුපකාර සේවක කොමිෂන් සභාව(බ.ප)
අංක 121/3 කිරුළපන මාවත
කොළඹ 05
2011. 11. ...21... දින

<u>බස්නාහිර පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා චක්‍රලේඛ අංක 2/2010 වැටුප් චක්‍රලේඛ ක්‍රියාත්මක වීමත් සමඟ අනුගමනය කළ යුතු සමුපකාර සේවකයින්ගේ උසස්වීම් පරිපාටිය හා විෂමතා ඉවත් කිරීම</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් එවන ලද මගේ සමාංක හා 201109.19 දිනැති 4/2011 චක්‍රලේඛය හා බැඳේ.

2. 4/ 2011 චක්‍රලේඛයේ ක්‍රියාත්මක දිනය 2010.04.01 ලෙස විය යුතු වන අතර, 2010.04.01 දින දක්වා සේවයේ නියුක්තව සිට දැනටමත් විශ්‍රාම ගොස් සිටින සේවකයින් සඳහා ද මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන බලපැවැත්වේ.

3. 4/2011 චක්‍රලේඛයේ පරිදි සේවකයින් නියමිත පන්ති (ශ්‍රේණි) වලට අන්තර්ග්‍රහණය කිරීමෙන් පසුව මීට අමුණා ඇති ඇමුණුම 01 ආකෘතියේ ප්‍රකාරව විස්තර සම්පූර්ණ කර අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයේ පිටපත ද සමඟ කොමිෂන් සභාවේ ආවරණ අනුමැතියට ඉදිරිපත් කරන ලෙස දන්වමි. කොමිෂන් සභාවේ ආවරණ අනුමැත ලැබීමෙන් අනතුරුව එක් එක් සේවකයා වෙනුවෙන් උසස්වීමට අදාළ පත්වීමේ ලිපියක් නිකුත් කළ යුතු වේ. ඒ සඳහා අදාළ කර ගත හැකි ආකෘතියක් මේ සමඟ ඉදිරිපත් කරමි. (ඇමුණුම 02)

4. 2/2010 වැටුප් චක්‍රලේඛය පරිදි 2010.04.01 දිනට වැටුප් පරිවර්තනය කිරීමෙන් අනතුරුව 4/2011 චක්‍රලේඛය පරිදි වැටුප් පරිවර්තනය කළ යුතුය.

5. 4/2011 චක්‍රලේඛයේ පරිදි උසස්වීම් ලබන සේවකයින්ගේ මීළඟ වැටුප් වර්ධක දිනය එම උසස් කළ දිනය ලෙස සැලකිය යුතුය.

අයි. ආර්. සෝමසිරි,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව
බස්නාහිර පළාත..

පිටපත් :-

1. බස්නාහිර පළාත් ප්‍රවාහන හා සමුපකාර අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම්
2. බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්
3. ලේකම්, බස්නාහිර පළාත් ප්‍රවාහන හා සමුපකාර අමාත්‍යාංශය
4. බස්නාහිර පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ත්‍රාර්
5. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (කොළඹ/කළුතර/ගම්පහ)
6. ලේකම්, මධ්‍යම රජයේ සමුපකාර සේවක කොමිෂන් සභාව
7. සියලුම පළාත් සමුපකාර කොමිෂන් සභා ලේකම්වරුන්
8. සියලුම වෘත්තීය සමිති සංගම්